# ශ්‍රී ලංකාවේ අඳ භුක්ති ක්‍රමයේ අර්බුදය සහ අනාගතය

ඉඩම් හිමියෙකු වෙනත් පුද්ගලයකු සමඟ ඇති කරගන්නා ලිඛිත හෝ වාචික ගිවිසුමක් යටතේ එම පුද්ගලයා ලවා කුඹුර වගා කරවා දෙදෙනා අතර අස්වැන්න බෙදා ගැනීම අඳ ක්‍රමය යටතේ වී වගා කිරීම යනුවෙන් හැඳින්විය හැකි ය. අස්වැන්න බෙදා ගන්නා ආකාරය, යෙදවුම් සැපයීමේ දී එකිනෙකාගේ කාර්යභාරය හා එකිනෙකා කළ යුතු කාර්ය කොටස් ගිවිසුමේ පැහැදිලිව සඳහන් වේ. ඉඩම් හිමියන්ගේ සමාජ-ආර්ථික පසුබිම මත සකසා ගන්නා ලද අඳ ක්‍රම කිහිපයක් ශ්‍රී ලාංකික ගොවි සමාජය තුළ ව්‍යවහාරයේ පවතී. මෙම ලිපියේ අරමුණ අඳ භුක්ති ක්‍රමයේ ඓතිහාසික තොරතුරු, එහි විකාශනය, ක්‍රියාකාරීත්වය හා වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනයක යෙදීම ය.

### අඳ භුක්ති ක්‍රමයේ ඉතිහාසය හා විකාශනය

පුරාණයේ සිට ම ශ්‍රී ලාංකිකයන්ට ආහාර සැපයීමේ පදනම වූ භූමිය ඉතා උසස් ස්ථානයක ලා සලකන ලදී. භූමියේ අයිතිකරු රජු විය. එබැවින් භූමිය අයිති තැනැත්තා යන අර්ථයෙන් රජු "භූපති", "පෘථිවි" වැනි අන්වර්ථ නාමවලින් හඳුන්වා ඇත. භූමියේ අයිතිකරුවා රජු බැවින් රජු සන්තකයේ පැවති ඉඩම් රටේ ජනතාවට ලබා දුන්නේ ය. සෙල් ලිපි වැනි මූලාශ්‍ර අනුව රජු ඉඩම් ලබාදුන් ආකාර කීපයක් හෙළි කර ගත හැකි ය. රජුට සේවය කිරීම වෙනුවෙන් ඉඩම් ලබාදීම එක් ක්‍රමයකි. ජීවත්වීම සඳහා එම ඉඩම් ලබාදුන් බැවින් එවා "දීවෙල්" නමින් හඳුන්වා ඇත. මෙලෙස රාජකාරිය සඳහා ලබාදුන් ඉඩම් එම රාජකාරීවල නිරත වූ පුද්ගලයන්ට අයත් විය. ඒ අනුව රජු හැරුණු විට රටේ ඉඩම් අයත් වූ අනෙක් කොටස වූයේ රටේ ප්‍රභූන් ය. මෙලෙස පාලකයන්ගෙන් ලැබුණු ඉඩම් ප්‍රභූන්ට අයත් වූ විට එම ඉඩම් ලද්දන් විසින් වෙනත් පුද්ගලයන්ට වගා කිරීම සඳහා ලබා දුන්නේ ය. ඒ අනුව රටේ ඉඩම් හිමිකරුවන් කොටසකුත් එම ඉඩම් වගා කරන්නන් නමින් තවත් කොටසකුත් සමාජයේ ඇති විය. පැරණි සෙල් ලිපි කිහිපයක ඉඩම් නොමැති පුද්ගලයින්ට ඉඩම් ලබාදී වගා කිරීම් පිළිබඳ තොරතුරු ඇතුළත් ය. ක්‍රි.ව. 4 වන සියවස දප්පුල රජු දවස "කොන්ඩවටවාන සෙල් ලිපිය" එවැනි තොරතුරු අඩංගු මූලාශ්‍රයකි. එහි "පාට්ටලද්දන්" "පමුණුලද්දන්" "කැබලිලද්දන්" යන නම්වලින් ඉඩම් හිමියන් හඳුන්වා ඇති අතර එම ඉඩම් හිමියන් විසින් වගාව සඳහා රටේ ජනයාට දුන් ඉඩම් "කැරැ ඉඩම්" නමින් හඳුන්වා ඇත. මෙම ඉඩම් වගා කළ පුද්ගලයින් "කුඩීන්" යනුවෙන් හඳුන්වා ඇත. ඔවුන් ඉඩම් හිමියන්ට ප්‍රවේණියක් ගෙවීමේ පදනම මත ඉඩම් වගා කර ඇත. කොණ්ඩවටවාන සෙල් ලිපිය, බදුලු සෙල් ලිපිය යන මූලාශ්‍රවල මෙම කුඩීන්ට ඉඩම් හිමියන් කරදර කළ බවත් කුඩීන් විසින් වගා කළ කැරැ ඉඩම්වලින් "පාට්ටලද්දන්" බදු ඉල්ලූ බවත් එලෙස බදු ඉල්ලීම තහනම් කරමින් ආඥා පනවා ඇති බවත් මෙම සෙල් ලිපි අනුව පෙනේ.

අඳ යන වචනය "අර්ධ", "අඩ්ඩ" යන පාලි වචනයෙන් බිඳී සිංහලයට පැමිණියකි. එනම් අඩක් යන්න යි. කුරුණෑගල යුගයේ රචනා වූ ජාතක කථා පොතේ කුරුධර්ම ජාතකයේ අඳ ගොවින් ගැන සඳහන් ය. දඹදෙණි යුගයේ සද්ධර්ම රත්නාවලියේ ද අඳ ගොවීන් ගැන සඳහන් ය. මහනුවර යුගයේ ජෝන් ඩොයිලිගේ විස්තර වාර්තාවේ ද අඳ ගොවීන් ගැන සඳහන් වේ. මහනුවර යුගයේ දී රජුගේ ගබඩා ගම්වලින් අඳ ගොවීන්ට බිත්තර වී ලබා දුන් බව සඳහන් වේ. "පියාගෙන් පුතාට උරුම වන අඳ ගොවි ක්‍රමය" මහනුවර යුගයේ පටන් ආරම්භ වන බවට තොරතුරු හෙළි වේ.

අඳ ගොවි ක්‍රමයේ විකාශනයේ මුල් අවධියේ දී රජුගේ ඉඩම් වගා කර බද්දක් ගෙවූ අය අඳ ගොවීන් විය. එසේ ම රජයේ ඉඩම් අනවසරයෙන් වගා කළ අඳ ගොවින් අඳ පරවේණි ගොවීන් නම් විය. පෘතුගීසි කාලයේ දී අඳ බද්ද මුළු අස්වැන්නෙන් 1/2 වී ඇත. ලන්දේසි යුගයේ දී කුඹුරේ වටිනාකම රජයට ගෙවා ඉඩම් අයිතිය ලබා ගත හැකි විය. පසුකාලීනව අඳ භුක්ති ක්‍රමය සංකීර්ණත්වයට පත් වෙමින් අඳ ක්‍රම කිහිපයක් ව්‍යවහාරයට එක් වී ඇති බව පෙනේ. එවා නම්

| | | |
|---|---|---|
| හරි අඳේ | - | අස්වැන්නෙන් 1/2 ක් කුඹුරු හිමියාට ගෙවීමේ ක්‍රමය |
| තුනෙන් අඳේ | - | අස්වැන්නෙන් 1/3 ක් කුඹුරු හිමියාට ගෙවීමේ ක්‍රමය |
| කරු අඳේ | - | අඳ ගොවියා විසින් තවත් ගොවියකු හවුල් කරගෙන එම හවුල් කරගත් ගොවියාගෙන් ඔහුගේ මී ගවයන් යොදා ගෙන සී සෑම, පෝරු ගෑම, කොළ මැඩවීම යන කාර්යයන් කරවා ගැනීම හා අඳ ගොවියාගේ කොටසින් භාගයක් එම ගොවියාට ලබාදීම |
| බිම් අඳේ | - | සියළු වියදම් අඳ ගොවියා විසින් දරනු ලබමින් වගාව කර අස්වැන්නෙන් 1/4ක් පමණක් ඉඩම් හිමියාට ලබා දීම. |

මඩරන් ක්‍රමය යනුවෙන් වූ ක්‍රමයක් මහනුවර, කෑගල්ල වැනි උඩරට ප්‍රදේශවල භාවිතා වී ඇත. මෙම ක්‍රමයේ දී කුඹුරු හිමිකරු කුඹුර වැඩි ම බදු ක්‍රමයකට දීමට උත්සාහ කරයි. කුඹුර ලබා ගැනීමට උනන්දුවක් දක්වන ගොවීන් "දැකුම් පෙට්ටියක්" ඉඩම් හිමියාට ලබාදිය යුතු ය. එම දැකුම් පෙට්ටියට කැවිලි වර්ග දුම්කොළ බුලත් පුවක් වැනි දෑ ද ඇතුළත් ය. වැඩි ම දැකුම් ප්‍රමාණයක් ගෙන යන ලද ගොවියාට කුඹුර ලබාදීම මෙම ක්‍රමය අනුව සිදු විය. ඒ අනුව වැඩිම දැකුම් රැගෙන යන තැනැත්තා ඉහළ ම බද්දක් ගෙවා කුඹුර අදාළ කන්නයේ දී වගා කිරීමට අපේක්ෂා කරන පුද්ගලයා විය හැකි බැවින් ඔහුට කුඹුර ලබාදීම සිදු විය. මෙම ක්‍රමය පිළිබඳ වැඩි විස්තර ආර්.ඩී. වනිගරත්න මහතාගේ අධ්‍යයනයක් වූ "Mahantegama Village" නැමති පොතේ හා "උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසන් සභා වාර්තාවේ" සඳහන් වේ.

## අඳ ගොවි පනත් හඳුන්වා දීමේ පසුබිම

ජනතාව ජීවත් වූ ප්‍රදේශවලින් ම ඔවුන් තම ප්‍රධාන ආහාර සපුරාගැනීම නිසා ශ්‍රී ලංකාවට නිදහස ලබා ගන්නා අවධිය වන 1940-1950 දශකවල ග්‍රාමීය ජනජීවිතයේ අතිශය වැදගත් ස්ථානයක් වී වගාවට ලැබී තිබුණි. සමාජයේ ජීවත් වූ සෑම පුද්ගලයෙකුට ම කුඹුරු ඉඩමක් හිමි ව නො තිබූ අතර, එවැනි පුද්ගලයින් කුඹුරු ඉඩම් වැඩි ප්‍රමාණයක් තිබූ සමාජයේ වත් පොහොසත්කම් ඇති අයගෙන් කුඹුරු ඉල්ලා ගෙන අඳ ක්‍රමය යටතේ වගා කර ප්‍රවේණිය දීමේ ක්‍රමයක් මෙකල පැවතිණි. මෙවැනි අඳ ගොවීන්ට හා ඔවුන්ගේ පවුල්වල සියළු සාමාජිකයින්ට ඉඩම් හිමියන්ගේ පවුල්වල විවිධ අවශ්‍යතාවයන්වල දී කිසිම ගෙවීමක් නො ලබා එම කාර්යයන් කර දීමට සිදු වී තිබුණි. මේ නිසා බොහෝ ඉඩම් හිමියන්ගේ පීඩාකාරී ක්‍රියාවලීන්ට මුහුණදීමට අඳ ගොවින්ට සිදු වී තිබුණි (හැන්සාඩ් වාර්තාව, 2000 අගෝස්තු 10). එබැවින් එකල සමාජයේ පීඩා විඳින පංතියක් ලෙස අඳ ගොවීන් කැපී පෙනිණි.

අඳ ගොවීන් හා වී වගාව සම්බන්ධයෙන් මෙවැනි පසුබිමක් ශ්‍රී ලංකාවේ පැවති අතර, මෙයට විසඳුම් ලෙස නිදහසින් පසු 1953 අංක 01 දරන කුඹුරු පනත හඳුන්වා දෙනු ලැබී ය. මෙයින් අපේක්ෂා කළේ කුඹුරු හිමියා සහ අඳ ගොවියා අතර ගිවිසුමක් ඇති කර අදාළ කුඹුරට පස් වසරක කාලයක් සඳහා අඳ ගොවිකම ආරක්ෂා කිරීම යි. මේ පනත යටතේ අඳ ගොවියකු ඉවත් කිරීම උසාවි නියෝගයකින් කළ යුතු විය. කුඹුරු බද්ධ ගෙවීම ස්ථිර ක්‍රමයක් ලෙසට සකස් කළේය. යම් කිසි ආකාරයකින් අඳ ගොවියාගේ අයිතිය සුරක්ෂිත කිරීමට මෙම පනතින් උත්සාහ ගෙන තිබුණ ද මෙය නීතියක් වශයෙන් රට පුරා ක්‍රියාත්මක කිරීමට හැකි වුයේ නැත.

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් නව ලිබරල්වාදී සමාජ-ආර්ථික ක්‍රමයක් ඇරඹුන ද කලින් පැවති වැඩවසම් ලක්ෂණ මුළුමණින්ම බිඳ වැටුණේ නැත. එම සමාජ-ආර්ථික පසුබිම තුළ කුඹුරු පනතක අවශ්‍යතාවය මතු කර තිබුණ අතර ඒ අවශ්‍යතාව මත 1958 අංක 01 දරන කුඹුරු පනත සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරගැනීම සිදු විය. මෙම කුඹුරු පනත ඉදිරිපත් කිරීමත් සමග ම 1953 අංක 01 දරන කුඹුරු පනත අවලංගු විය. 1958 අංක 01 දරන පනතේ මූලික අරමුණ වූයේ අඳ ගොවීන්ගේ අඳ ගොවි අයිතිය සුරක්ෂිත කිරීම, ඉඩම් බද්ධ නිශ්චය කිරීම, ගොවි කුළීකරුවන් ස්ථාපිත කිරීම, මොවුන්ගේ මිල නියම කිරීම, ගොවි කාරක සභා පිහිටුවීම හා එමගින් පනත සම්බන්ධ කටයුතු පාලනය කිරීම, අඳ ගොවි ගැටළු පරීක්ෂා කිරීම, අඳ ගොවි නෙරපීම් වැනි ගැටළු පිළිබඳ අභියාචනා ඉදිරිපත් කිරීමට තැනක් ස්ථාපිත කිරීම ආදිය යි.

කුඹුරු පනත නැතහොත් ගොවි පනත ඉදිරිපත් කරමින් 1958 දී පාර්ලිමේන්තුවේ දී කළ කතාව ඇතුළත් හැන්සාඩ් වාර්තාවට අනුව එම පනත මගින් පරමාර්ථ කිහිපයක් ම සාධනය කරගැනීමට බලාපොරොත්තු වූ බව පෙනේ. එම පරමාර්ථ පනතේ දක්වා ඇත්තේ "කුඹුරු වගා කරන අඳ ගොවීන්ගේ අඳය රැක දීමටත්, අඳ ගොවීන් විසින් කුඹුරු හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීමටත්, කුළී ගොවීන්ගේ කුළිය ගොවි සභා මගින් නියම කරවීමට හා කුළී ගොවියන් අඳ ගොවියන් හා සමූහ ගොවියන් ලෙස පත් කිරීමටත් කුඹුරු කැබලි එක්කර මහ කුඹුරු යායවල් ඉදි කිරීමත්" යනුවෙනි. එම වාර්තාව තවදුරටත් විමර්ශනය කරන විට මෙම පනත තුළින් වී වගාවේ අස්වැන්න වැඩි කිරීමත් දිගුකාලීන පරමාර්ථයක් වී ඇති බව පෙනේ. මෙම පනත තවදුරටත් විමර්ශනය කිරීමේ දී පෙනී යන්නේ 1958 වර්ෂය වන විට කුඹුරු අක්කරයකින් ලබා ගෙන ඇති අස්වැන්න ඉතා පහළ මට්ටමක පැවති බව යි. එවකට මෙරට තිබූ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ව ඉතාම නිවැරදි සංඛ්‍යාලේඛන නොමැති වුව ද, ගණන් තැබීමේ දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලැබූ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම් අනුව 1945-1946 රටේ කුඹුරු අක්කර 8,999,70 ක් පැවති අතර, 1954-1955 වන විට අක්කර 1031611 දක්වා වර්ධනය වී තිබේ. අක්කරයකින් ලබා ගත හැකි සාමාන්‍ය අස්වැන්න වී බුසල් 32 ක් විය. මෙම අස්වැන්න ලෝකයේ වී වගා කරන වෙනත් රටවල සාමාන්‍ය වී අස්වැන්නට වඩා අඩු ප්‍රමාණයක් විය. මේ නිසා රටේ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වී වගා අක්කරයකින් ලබා ගන්නා සාමාන්‍ය අස්වැන්න වැඩි කළ යුතු වූ අතර ඒ සඳහා හඳුනාගත් ක්‍රියාමාර්ගයන් වූයේ රටේ අඳ ගොවීන්

මෙතෙක් සිටි අස්ථාවරභාවයෙන් මුදවා ඔවුන්ට ස්ථිරත්වයක් ලබාදීම යි. එවකට ශ්‍රී ලංකාවේ පැවති කුඹුරු අක්කර ප්‍රමාණයෙන් 55%ක් කුඹුරු අයිතිකාර ගොවීන් විසින් වගා කරන ලද අතර 28%ක් අඳේට වැඩ කරන කුඹුරු විය. බද්දට වැඩ කරන කුඹුරු 13.7% ක් විය. තට්ටුමාරු ක්‍රමයට වැඩ කරන කුඹුරු 2.6% ක් විය. කුඹුරු පනත ක්‍රියාත්මක වීම සමග ම 1956 අප්‍රේල් 12 වන ද වන විට යම් කිසි අඳ ගොවියකු කුඹුරක් අඳයට වගා කළේ නම් ඔහු එම කුඹුරේ අඳ ගොවියා වශයෙන් ස්ථිර වන්නේ ය. ඔහු ඉවත් කිරීමට ඉඩම් හිමියට හැකියාවක් නැත. අඳ ගොවියා විසින් කුඹුරු හිමියාට ගෙවිය යුතු බද්ද නියම කිරීම මෙහි ඇති අනෙක් විශේෂත්වය යි. එනම් එක කන්නයකින් ලැබෙන මුළු අස්වැන්න ප්‍රමාණයෙන් බුසල් 15 ක් හෝ මුළු අස්වැන්නෙන් හතරෙන් කොටසක් හෝ මේ දෙකෙන් කොයි එකෙන් හෝ අඩු කොටස ඉඩම් හිමියාට දිය යුතු ය. මෙම පනත අනුව කුඹුරේ අස්වැන්න ගොවියා විසින් මහන්සි වී වගා කොට වැඩි කර ගත හොත් ඉඩම් හිමියාට බුසල් 15ක් පමණක් දිය යුතු අතර වැඩි සියල්ල ම අඳ ගොවියාට අයත් වේ. එම නිසා අඳ ගොවීන් අස්වනු වැඩි කරගැනීමට උත්සුක වන්නේ යයි පනතින් අපේක්ෂා කර ඇත.

ගොවිතැන නගා සිටුවීම අරඹයා ගොවීන්ට ගොවිතැන සාර්ථක අන්දමින් කරගෙන යාම පිණිස "ගොවි සභා" නැමති ගොවීන්ගේ ම සංවිධානයක් පිහිටුවීම ද මෙම පනතින් යෝජනා කර ඇත. මෙම සංවිධානය ගොවීන්ට අවශ්‍ය මුදල් ණයට දීම, උපකරණ හා පොහොර සපයාදීම වැනි අවශ්‍යතා ඉටු කිරීම සඳහා පිහිටුවන ලද අතර එහි ද අවසාන බලාපොරොත්තුව වී ඇත්තේ වගාවේ අක්කරයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය වැඩි කිරීම යි.

ඉඩම් හිමියන්ට ද මෙම පනතින් යම් කිසි ආකාරයක සහනයක් සපයා දී ඇති බව පෙනේ. එනම් යම් කිසි ඉඩම් හිමියෙකුට තමාගේ කුඹුර තමන් විසින් ම වගා කිරීම සඳහා වුවමනාවක් ඇත්නම් මෙම කුඹුරු පනත පනවා වසර 5 ක් ගතවීමට පෙර ඒ බව දන්වා ගොවිජන සේවා කොමසාරිස්වරයාට ඉල්ලුම්පතක් යැවිය යුතු ය. එම ඉල්ලීම සත්‍ය හා අවංක එකක් යැයි කොමසාරිස්වරයාට ඔප්පු වුව හොත් අඳ ගොවියාට කුඹුරින් ඉවත්වීමට අවුරුදු දෙකක් කල් දී කුඹුරු හිමියාට ම තමන්ගේ කුඹුරු වගා කටයුතු කරන්නට මෙම පනතින් ඉඩ සලසා ඇත. පනත පනවන අවධිය වන විට අඩු වයස්වල සිටියවුන්ට ද අවුරුදු විසි එක වූ විට මෙම පස් අවුරුදු කාල සීමාවෙන් පසුව වුවත් සිය කුඹුරේ වැඩ කිරීමට වුවමනා නම් එසේ කිරීමට පනතින් ම ඉඩකඩ සලසා ඇත.

**1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත**

කාලයෙන් කාලයට කෘෂිකර්මය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්ති වඩාත් ඵලදායී ලෙසින් ක්‍රියාත්මක කරවීම සඳහා නීති සකසා ගනී. එවැනි නීති පනත් මඟින් එළි දක්වයි. එවකට පැවති රජයේ කෘෂිකාර්මික අභිලාෂයන් ක්‍රියාවට නැගීම පිණිස විධිවිධාන සැලැස්වීම පිණිස 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත සකස් කර සම්මත කර ගන්නා ලදී. කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම, ගොවි කාරක සභා පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම හා එවායේ බලතල හා යුතුකම් නියම කිරීම, කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධ ආරවුල් කෘෂිකර්ම විනිශ්චය අධිකාරී මඟින් විසඳීමට විධිවිධාන සැලැස්වීම සහ 1958 අංක 01 දරන කුඹුරු පනත ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීම යන සුවිශේෂී අරමුණු මත මෙම පනත ඉදිරිපත් කර ඇත. මෙම පනතින් අඳ ගොවීන් සම්බන්ධයෙන් සුවිශේෂී වෙනස්කම් සිදු කර නොමැති අතර අඳ ගොවීන් සුරක්ෂිත වීම මෙයින් ද ස්ථාවර විය.

**1979 අංක 48 දරන ගොවිජන සේවා පනත**

කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම, ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම, කුඹුරු හා වෙනත් ඉඩම් ආශ්‍රිතව පශු සම්පත්වලින් උපරිම ඵලද වර්ධනයක් ලබා ගැනීම, ගොවිජන සේවා කාරක සභා පිහිටුවීම, වගා නිලධාරීන් පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත ඉදිරිපත් කරන ලදී.

මෙම පනත මඟින් 1958 කුඹුරු පනතට සුළු සුළු වෙනස්කම් සිදු කර ඇතත් එතරම් ම විශාල වෙනස්කම් සිදු කර නැත. එහෙත් ඉඩම් හිමියාට ගෙවිය යුතු බද්ද සම්බන්ධයෙන් පැහැදිලි වෙනස්කමක් මෙම පනතින් සිදු කර තිබේ. පනතේ 17 (1) වගන්තිය අනුව යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා අඳ ගොවියා විසින් ගෙවිය යුතු බද්ද කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් කලින් කල නිශ්චය කළ යුතු ය. කුඹුරු අක්කරයකින් වී බුසල් පහළොවකට නොවැඩි ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයේ මුළු අස්වැන්නෙන් නියමිත අඩු කිරීම් කළ පසු ඉතිරි කොටසින් හතරෙන් එක් පංගුවකට නොවැඩි කොටසක් හෝ යන දෙකින් වඩා වැඩි ප්‍රමාණය ඒ එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද ලෙස නියම කර ඇත. මෙහි විශේෂත්වය වන්නේ අක්කරයකට බුසල් 15 හෝ මුළු අස්වැන්නෙන් 1/4 යන දෙකින් වැඩි කොටස ඉඩම් හිමියාට දීම යි. අඳ ගොවිතැන සුරක්ෂිත කරගැනීම සඳහා මෙන් ම

වැඩිවන අස්වැන්නේ වාසිය අඳ ගොවියාට මෙන් ම ඉඩම් හිමියාට යන දෙපාර්ශ්වයට ම ලැබෙන පරිදි මෙම පනත සකසා ඇති බව පෙනේ. මෙතෙක් පැවති පනත්වල පැවතියේ අඩු කොටස ඉඩම් හිමියාට ලබාදීමේ ක්‍රමය යි.

## වර්ෂ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත

අඳ ගොවීන්, ඉඩම් හිමියන් යන පාර්ශ්ව දෙකෙන් කැමති එක් පාර්ශ්වයකට ඉඩම් මිල දී ගැනීමට පෙළඹවීම සඳහාත්, ඉඩම් අවශ්‍ය පුද්ගලයන්ට ඉඩම් තොරතුරු සපයා දෙන ඉඩම් බැංකුවක් පිහිටුවීමටත්, ඉඩම් මිලදී ගැනීමේ දී මුදල් අග හිඟකම් ඇති පුද්ගලයන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම සඳහා ගොවිජන සංවර්ධන අරමුදලක් ඇති කිරීමත් අඳ ගොවීන්ට කිසියම් වන්දි මුදලක් ගෙවීමට අවශ්‍ය වුව හොත් ඒ සඳහා වූ වැඩපිළිවෙළ හඳුන්වාදීමටත්, ශ්‍රී ලංකාව තුළ වගා කළ හැකි ඉඩම් සියල්ල වගාව සඳහා ප්‍රශස්ත ලෙස යෙදීමටත්, කුඹුරු ඉඩම් බලෙන් ගොඩ කිරීම නැවැත්වීමටත්, ගොවි ජනතාවගේ ප්‍රශ්න ගමේ දී ම විසඳ අවසන් කිරීම සඳහා ගොවිජන විනිශ්චය සභා පිහිටුවීමත් යන අරමුණු කිහිපයක් උදෙසා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සම්මත කරන ලදී. මෙම පනතෙන් අඳ ගොවියන් සම්බන්ධයෙන් ඍජු බලපෑමක් ඇති වුණි. 1958 අංක 01 දරන කුඹුරු පනතේ සිට මෙම 2000 අංක 46 දරන පනත තෙක් ම ශ්‍රී ලංකාවේ ක්‍රියාවට නැංවුණ ගොවිජන පනත් මගින් නීත්‍යානුකූල අඳ ගොවියාගෙන් පසුව ඔහුගේ දරුවන්ටත් එසේ දරුවන් නොමැති කල අඳ ගොවියා නම් කරන පුද්ගලයෙකුටත් ආදී වශයෙන් අඳ ගොවිකම අඳ ගොවියන්ගේ පවුලේ හෝ එහි ඥතීන් අතරම රැඳී පැවතුණි. එහෙත් 2000 පනත අනුව අඳ ගොවියාගේ පාර්ශ්වය හෝ ඉඩම් හිමියාගේ පාර්ශ්වය යන පාර්ශ්ව දෙකින් එක් පාර්ශවයක් ඔවුනොවුන්ගේ කැමැත්ත මත අදාළ කුඹුරු ඉඩම මිලදී ගනීවි ය යන අපේක්ෂාවෙන් මෙම පනත ඉදිරිපත් කර ඇති නිසා පෙර අඳ ගොවි පනත්වල මෙන් පසු උරුමය පැවරීම සම්බන්ධ වගන්ති මෙහි ඇතුළත් කර නැත. එම නිසා නීත්‍යානුකූල අඳ ගොවියා මිය යාමෙන් පසු ඔහුගේ කාලත්‍රයා හෝ දරුවන්ට අඳ කුඹුරේ අයිතිය හිමිවීම නැවතීමක් සිදු වී ඇත. පනතේ මෙම වගන්තියෙන් ලත් හිදැස ප්‍රයෝජනයට ගෙන ඉඩම් හිමියන් අඳ ගොවීන්ගේ දරුවන්ට කුඹුරුවලට ඇතුල්වීමට ඉඩ නොදී බලෙන් ඔවුන්ගේ සන්තකයට කුඹුරු ලබාගැනීමේ ප්‍රවණතාවයක් වර්ධනය වී ඇත. මේ නිසා, 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා දශකයක පමණ කාලයක අඳ ගොවීන් "පහ කිරීම" සම්බන්ධව පැමිණිලි රාශියක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබෙමින් පවතී. ශ්‍රී ලංකාවේ වැඩි ම අඳ ගොවීන් පිරිසක් සිටින දිස්ත්‍රික්ක වන මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල මෙම තත්ත්වය වර්ධනය වීම නිසා ඉඩම් හිමි අඳ ගොවි ආරවුල් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවල ගොඩගැසී ඇත. අඳ ගොවි ඉඩම් හිමි ආරවුල් සම්බන්ධයෙන් හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට 2008 දී පැමිණිලි 84 ක් ද, 2009 දී 57 ක් ද ලැබී තිබිණි. මාතර දිස්ත්‍රික් කාර්යාලයට 2008 දී පැමිණිලි 296 ක් ද, 2009 දී 332 ක් ද ලැබී ඇත. ගොවිජන විනිශ්චය සභා නම් ආයතනය ද අක්‍රීයව පවතින බැවින් මෙම ආරවුල් විසඳීමට යාන්ත්‍රණයක් නොමැතිකමින් මෙම ආරවුල් දිස්ත්‍රික් කාර්යාලවල එකතු වී ඇත.

මෙතෙක් සඳහන් කරන ලද කරුණු අනුව 1950 දශකයේ දී ඉඩම් හිමියන්ගේ විවිධ ගැහැටවලට ලක්වෙමින් අස්ථිරව සිටි අඳ ගොවින්ට 1958 අංක 01 දරන කුඹුරු පනත මගින් ස්ථිරත්වයක් ආරෝපණය වූ අතර 1973 අංක 42 දරන පළදුවර්ධන පනත, 1979 අංක 58 ගොවිජන සේවා පනත යන පනත්වලින් ද අඳ ගොවින්ගේ පැවැත්ම ස්ථාවර විය. එහෙත් අඳ ගොවීන් ඉඩම් හිමි ගොවීන් බවට පත් කිරීමේ අරමුණින් යුතුව ඉදිරිපත් කරන ලද 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ අපේක්ෂිත පරමාර්ථ ඉටු නො වීම නිසාත්, වී වගාව සම්බන්ධ පොහොර සහනාධාරය සහ වී සඳහා ඉහළ මිලක් ලැබීම හේතුවෙන් ඉඩම් හිමියන් එම ඉඩම් නැවත අයත් කරගැනීම කෙරෙහි කැමැත්තක් දැක්වීම නිසාත්, අඳ අයිතිය සම්බන්ධ ගැටළු සහගත තත්ත්වයක් ගොවි සමාජය තුළ නිර්මාණය වී තිබේ.

වර්තමාන සමාජ-ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් සහ අඳ ගොවීන්ගේ මෙන් ම ඉඩම් හිමියන්ගේ ද අභිලාෂයන් පිළිබඳ ව පැහැදිලි අවබෝධයක සිට නව ගොවිජන සංවර්ධන පනතක් ඉදිරිපත් කිරීම වර්තමානයේ අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. මෙම පනතේ අඳ ගොවින් පිළිබඳ පනවන ලද වගන්තිවලින් වර්තමානයේ පැන නැගී ඇති අඳ ගොවි ප්‍රශ්න මග හැරී යා යුතු අයුරින් අවශ්‍ය සංශෝධන එක් කරන්නේ නම් එය සාර්ථක පනතක් බවට පත් වන්නේ ය. මේ සඳහා අඳ ගොවීන්ගේ, ඉඩම් හිමියන්ගේ සහ සමාජයේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව උනන්දුවක් දක්වන විද්වතුන්ගෙන් අදහස් ලබා ගැනීම හා පුළුල් සාකච්ඡාවකට භාජනය කිරීම මගින් වඩාත් තිරසාර අඳ ගොවි පනතක් නිර්මාණය කර ගත හැකි බව අවසාන වශයෙන් සඳහන් කළ හැකි ය.

**ආර්.එල්.එන්. ජයතිස්ස**
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය